සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
## ஆண்டிறுதி மதிப்பீடு - 2020
## Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විත ය.

(ii) එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලුම ප්‍රශ්න වලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

---

❖ **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

(01) වර්ෂණය, උෂ්ණත්වය, පීඩනය, සුළං ආදී සියලුම කාලගුණික සංසිද්ධීන් ඇතිවන්නේ ....................................... ගෝලයේ ය.

(පරිවර්තී / අපරිවර්තී / මෙසෝ)

(02) පෘථිවියේ මුළු භූමි ප්‍රමාණයෙන් ........................... ක් ගොඩබිම් ය.

(71% / 20% / 29%)

(03) සම්පූර්ණයෙන්ම ගොඩබිමින් වටවූ මුහුදක් ලෙස ........................... හඳුන්වා දිය හැකි ය.

(කළු මුහුද / එරල් මුහුද / චීන මුහුද)

(04) තිරිඟු වගාව සඳහා වඩාත් යෝග්‍ය වන්නේ ................................. පස ය.

(ලෝම සහිත වැලි/ ලැටරයිට්/චර්නෝසම්)

(05) 1:50 000 භූ ලක්ෂණ සිතියමක පරිමාණයට අනුව භූමියේ සැබෑ දුර කිලෝමීටර් එකක් දක්වන්නේ සෙන්ටිමීටර් ................. කින් ය.

(1 / 2 / 4)

❖ **අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් 'නි' යන්න වටා ද, වැරදි නම් 'වැ' යන්න වටා ද රවුමක් අඳින්න.**

(06) ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය සිදුවන්නේ ජෛවගෝලය තුළ ය. (නි / වැ)

(07) ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය තලවකැලේ ප්‍රදේශයේ පිහිටුවා තිබේ. (නි / වැ)

(08) 1:50 000 පරිමාණයට සකස් කළ ශ්‍රී ලංකා භූ ලක්ෂණ සිතියම්වල සමෝච්ච රේඛා අන්තරය මීටර් 10 කි. (නි / වැ)

(09) සාර්ක් රටවල් අතර ඉහළ ම මානුෂ සංවර්ධනයක් ඇති රට ඉන්දියාව ය. (නි / වැ)

(10) ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව ප්‍රධාන සංචාරක කලාප හතකට බෙදා ඇත. (නි / වැ)



EXAMRESULTS.LK

❖ **අංක 11 සිට 18 තෙක් ප්‍රශ්න වල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

(11) මැඩගස්කර් දූපත පිහිටා ඇත්තේ ............................... මහාද්වීප තටකය තුළ ය.


(12) ජලයෙන් වට වූ විවිධ හැඩයෙන් යුත් කුඩා ගොඩබිම් .................................. යනුවෙන් හඳුන්වයි.

(13) ඕක්, මේපල්, බීච් පොප්ලර් වැනි වෘක්ෂලතා බහුලවම දක්නට ඇත්තේ ................................ වනාන්තරවල ය.

(14) අයිජැෆ්ජල්ලා ජෝකුල් ගිනිකන්ද පිහිටා ඇති රට ............................................... යි.

(15) වෙරළ සීමාවේ සිට නාවික සැතපුම් 12ක් දුරට විහිදෙන මුහුදු සීමාව හඳුන්වන්නේ .............................. මුහුදු සීමාව නමින් ය.

❖ **අංක 16 සිට 18 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාරය උපයෝගී කර ගන්න.**




ලෝක වානේ නිෂ්පාදනයේ කාලීන ප්‍රගතිය

මූලාශ්‍රය - ***http://www.wikipedia.org (2014.02.10)***

ඉහත ප්‍රස්තාරයට අනුව,

(16) ලෝක වානේ නිෂ්පාදනයේ අඩුම ප්‍රගතියක් සිදුවී ඇත්තේ ............................... වර්ෂයේදී ය.

(17) 2003 වර්ෂයේදී ලෝක වානේ නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන ................ ක් පමණ වේ.

(18) ලෝක වානේ නිෂ්පාදනයේ ශීඝ්‍ර පසුබෑමක් සිදු වී ඇත්තේ ..................... වර්ෂයේදී ය.

❖ අංක 19 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්න වල 'අ' සහ 'ආ' යනුවෙන් තීරු දෙකක් දක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව 'ආ' තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.

(19)

| "අ" සුළි සුළං ඇති වන ප්‍රදේශය | "ආ" හඳුන්වන නම |
|---|---|
| 1. පිලිපීන් දූපත් ආශ්‍රිත මධ්‍යම පැසිපික් සාගරය | A. සයික්ලෝන් |
| 2. බෙංගාල බොක්ක අවට ඉන්දියන් සාගරය | B. හරිකේන් |
| 3. උතුරු අත්ලාන්තික් සාගරය | C. බැගියෝ |
| | D. විලිවිලීස් |

(1) A,B,C (2) C,A,B (3) D,B,A (4) A,C,D (........)

(20)

| "අ" ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගැටලු | "ආ" ඒවාට විසඳුම් |
|---|---|
| 1. මාර්ග තදබදය | A. ඉහළ ප්‍රමිතියකින් යුතුව මාර්ග සංවර්ධනය |
| 2. නිශ්චිත වේලාවක් තුල ගමනාන්තයට ළඟාවිය නොහැකි වීම | B. අධිවේගී මාර්ග ඉදිකිරීම |
| 3. මාර්ග අබලන්වීමට සාපේක්ෂව නඩත්තු නොකිරීම | C. බහාලුම් පර්යන්ත සංවර්ධනය |
| | D.ගුවන් පාලම්, උමං මාර්ග ඉදිකිරීම |

(1) A,C,B (2) B,C,A, (3) D, B, A (4) C,D,B (........)

(21)

| "අ" යකඩ හා වානේ නිෂ්පාදනයට ප්‍රමුඛ රටවල් | "ආ" නිෂ්පාදන මධ්‍යස්ථානය |
|---|---|
| 1. එක්සත් රාජධානිය | A. මැන්චූරියා ප්‍රදේශය |
| 2. රුසියාව | B. ග්ලාස්ගෝ ප්‍රදේශය |
| 3. චීනය | C. කුස්නෙට්ස් ප්‍රදේශය |
| | D. බර්මිංහැම් ප්‍රදේශය |

(1) A,D,C (2) D,B,C (3) B,C,A (4) D,C,A (........)

(22)

| "අ" ජල විදුලි බලාගාර | "ආ" ආශ්‍රිත ගංගාව |
|---|---|
| 1. ඉගිනියාගල | A. මහවැලි ගඟ |
| 2. සමනල වැව | B. කැළණි ගඟ |
| 3. රන්ටැඹේ | C. වලවේ ගඟ |
| | D. ගල්ඔය |

(1) D,C,A (2) C,B,A (3) A,C,D (4) B,C,D (........)

(23)

| "අ" පිහිටි ස්ථාන | "ආ" වනජීවී රක්ෂිත |
|---|---|
| 1. යාල | A. අභය භූමි |
| 2. විල්පත්තු | B. වන රක්ෂිත |
| 3. නකල්ස් | C. ජාතික උද්‍යාන |
| | D. දැඩි ස්වාභාවික රක්ෂිත |

(1) A,C,B (2) D,C,B (3) D,B,C (4) B,C,A (........)

(24) "අ" රට | "ආ" මිලියන නගරය

1. බ්‍රසීලය — A. නිව්යෝර්ක්
2. ඇමෙරිකා එක්සත් ජනපදය — B. කයිරෝ
3. ජපානය — C. රියෝ ද ජැනයිරෝ
 — D. ටෝකියෝ

(1) C,A,D (2) B,A,D (3) C,B,D (4) C,B,A (........)

❖ **අංක 25 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුරු තෝරා, ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

(25) ලෝකයේ සාගරවල විශාලත්වය අනුව වැඩිම විශාලත්වයකින් යුක්ත සාගරය මින් කුමක්ද?
(1) ඉන්දියන් සාගරය (2) අත්ලාන්තික් සාගරය
(3) පැසිපික් සාගරය (4) ආක්ටික් සාගරය (........)

(26) කිරිගව සම්පත් හුවමාරු කර ගැනීම සඳහා කිරිගව සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවා ඇති ප්‍රදේශයක් වන්නේ,
(1) අඹේවෙල ය. (2) කනන්විල ය. (3) වල්පිට ය. (4) මීවනපලාන ය. (........)

(27) • 2000mm වැඩි වර්ෂාපතනය
• $27^0C$ පමණ සාමාන්‍ය උෂ්ණත්වය
• කබොක් මිශ්‍ර රතු පස
ඉහත භෞතික සාධක වඩාත් උචිත වන ව්‍යාපාරික බෝගය කුමක් ද?
(1) තේ (2) රබර් (3) පොල් (4) කුරුඳු (........)

(28) පහත සඳහන් කර්මාන්ත අතුරින් එකලස් කිරීමේ කර්මාන්ත සණයට අයත් **නොවන** කර්මාන්තය වන්නේ කුමක් ද?
(1) යකඩ හා වානේ (2) මෝටර් රථ (3) නැව් (4) විද්‍යුත් (........)

(29) දැනට සොයාගෙන ඇති පැරණි ම සිතියම ලෙස සැලකෙන මැටි පුවරුවක අඳින ලද සිතියම නිර්මාණය කර ඇත්තේ කුමන ශිෂ්ටාචාරයක වැසියෙකු විසින් ද?
(1) ග්‍රීක (2) රෝම (3) මෙසපොතේමියානු (4) චීන (........)


(30) ශ්‍රී ලංකාවේ කජු වගාව ව්‍යාප්ත වී ඇති ප්‍රධාන දිස්ත්‍රික්ක දෙක කුමක් ද?
(1) මන්නාරම හා පුත්තලම (2) මාතලේ හා කෑගල්ල
(3) පුත්තලම හා කළුතර (4) මහනුවර හා හම්බන්තොට (........)

(31) ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පිහිටි වී පර්යේෂණායතනය කුමක් ද?
(1) බතලගොඩ (2) අම්බන්තොට (3) බෝඹුවල (4) මහඉලුප්පල්ලම (........)

(32) වීදුරු නිෂ්පාදනයේදී ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස යොදාගනු ලබන ඛනිජ වැලි වර්ගය වන්නේ පහත සඳහන් ඒවායින් කවරක් ද?
(1) ඉල්මනයිට් (2) මොනසයිට් (3) රූටයිල් (4) සිලිකා (........)

(33) ග්ලැසියර දිය වූ ජලයෙන් ආරම්භ වන ගංගාවක් වන්නේ,
(1) රයින් ගඟ (2) නයිල් ගඟ (3) තේම්ස් ගඟ (4) ඉන්දු ගඟ (........)

❖ අංක 34 සිට 36 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන රූප සටහන උපයෝගී කර ගන්න.



1 රූපය 2 රූපය 3 රූපය

(34) අංක 1 දරණ රූප සටහනේ A - B රේඛාවෙන් දැක්වෙන්නේ
(1) කඳු වැටියකි (2) කපොල්ලකි (3) නෙරුවකි (4) නිම්නයකි (........)

(35) අංක 2 දරණ රූප සටහනේ C - D රේඛාවෙන් දැක්වෙන්නේ
(1) දළ බෑවුමකි (2) මොහොර බෑවුමකි (3) උත්තල බෑවුමකි (4) අවතල බෑවුමකි(........)

(36) අංක 3 දරණ රූප සටහනේ කොත්කන්ද මුදුනේ ත්‍රිකෝණමිතික ස්ථානයකි. එහි උස ප්‍රමාණය විය හැක්කේ,
(1) 710 කි (2) 612 කි (3) 562 කි (4) 523 කි (........)

❖ පහත **A,B,C,D** වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 37 සිට 40 තෙක් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - 1. සෞඛ්‍ය පහසුකම්
2. වසංගත රෝග

B - 1. සුනාමි
2. වර්ෂාපතනය

C - 1. කර්මාන්ත
2. ගෝලීය උෂ්ණත්වය

D - 1. මානුෂ සංවර්ධනය
2. සාක්ෂරතාව

(37) පළමුවැන්නේ පැවැත්ම සඳහා දෙවැන්න අත්‍යවශ්‍ය වේ යැයි සිතිය හැකි මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (........)

(38) දෙවැන්නේ වැඩිවීමට පළමුවැන්නේ වැඩිවීම බලපාන මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (........)

(39) පළමුවැන්නේ අඩුවීමක් දෙවැන්නේ වැඩිවීම කෙරෙහි බලපාන මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (........)

(40) පළමුවැන්න හා දෙවැන්න අතර ඍජු සබඳතාවක් නොදක්වන මාතෘකා යුගලය කුමක් ද?
(1) A (2) B (3) C (4) D (........)

(ලකුණු 1 x 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / **Paper**: II | කාලය / காலம் / **Time**: පැය 02 |

සැලකිය යුතුයි:

- මෙම ප්‍රශ්න පත්‍රය I සහ II වශයෙන් කොටස් 02කි.
- I කොටස අනිවාර්ය වේ. II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.

## I කොටස

(01) (අ) ඔබ වෙත සපයා ඇති 1: 50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කොට ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (**පිටු අංක 11**) යොදා ගන්න.
අංක (i) සිට (iv) දක්වා ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) අංක (1) න් දක්වා ඇත්තේ කුමක් ද?
(ස්ථානීය උස / ත්‍රිකෝණමිතික උස / සංචාරක බංගලාව) (ල. 01)

(ii) අංක (2) න් දක්වා ඇත්තේ කුමක් ද?
(අඩිපාර / වේල්ල / වාරිමාර්ගය) (ල. 01)

(iii) අංක (3) න් දක්වා ඇත්තේ කුමක් ද?
(කපොල්ල / කඳුවැටිය / නෙරුව) (ල. 01)

(iv) අංක (4) න් දක්වා ඇත්තේ කුමක් ද?
(ලඳු කැලෑ / වනාන්තර / කඩොලාන) (ල. 01)

(v) ප්‍රදේශයේ බහුලවම ව්‍යාප්ත වී ඇති ව්‍යාපාරික භෝගය නම් කරන්න. (ල. 01)


(vi) සිතියමට පහළින් ඇති දිශා සටහනේ චුම්භක උතුර දැක්වෙන්නේ
කුමන ඉංග්‍රීසි අක්ෂරයෙන් ද? (ල. 01)

(vii) සිතියම මැද කොටුකර ඇති ප්‍රදේශය තුළ පිහිටි පොදු ගොඩනැගිලි එකක් නම් කරන්න. (ල. 01)

(viii) කොටුකර ඇති ප්‍රදේශයේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර වලින් සඳහන් කරන්න. (ල. 01)

(ix) සිතියමේ x සිට y දක්වා හරස්කඩක් අඳිනු ලැබුවහොත් එය පහත දක්වා ඇති F,G,H යන හරස්කඩ අතුරෙන් කුමක් විය හැකි ද? (ල. 01)

F




X Y

G




X Y

H




X Y

(x) සිතියමේ නැගෙනහිර මායිමෙන් ප්‍රදේශයට පිවිස බටහිර මායිමෙන් ප්‍රදේශය හැර යන ප්‍රධාන ගංගාව හරහා ඉදිකර ඇති පාලම් ගණන කොපමණ ද? (ල. 01)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතිමයට යාබදව දක්වා ඇති තීරුව **(පිටු අංක 9)** යොදා ගන්න.

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i) ඇල්ප්ස් කඳුවැටිය (A), (B), (C)

(ii) ඇමේසන් ගංගාව (D), (E), (F)

(iii) රතු මුහුද (G), (H), (J)

(iv) 2020 වර්ෂයේ ඔලිම්පික් ක්‍රීඩා උළෙල පැවැත්වීමට නියමිතව තිබූ ටෝකියෝ නගරය (K), (L), (M)

(v) කිරිපට්ටි පාලනයට ප්‍රසිද්ධ රටක් වූ නවසීලන්තය (P), (Q), (R) (ල. 05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර, පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරුර සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ලංකා සිතියමට යාබදව දක්වා ඇති තීරුව **(පිටු අංක 9)** යොදා ගන්න.

අංක (i) සිට (v) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් දී ඇති ඉංග්‍රීසි අක්ෂර තුන අතුරෙන් නිවැරදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා සිතියමට යාබදව ඇති තීරුවේ එක් එක් ප්‍රශ්න අංකය ඉදිරියේ ඇති කොටුව තුළ ලියා දක්වන්න.

(i) බෝඹුවල වී පර්යේෂණයතනය (A), (B), (C)

(ii) රත්නපුර දිස්ත්‍රික්කය (D), (E), (F)

(iii) යාල වනෝද්‍යානය (G), (H), (J)

(iv) මහවැලි ගඟේ අතු ගංගාවක් වන බදුලු ඔය (K), (L), (M)

(v) නොරොච්චෝලේ තාප විදු බලාගාරය (P), (Q), (R) (ල. 05)

## II කොටස


(02) (i) පෘථිවි ව්‍යුහයේ ප්‍රධාන ස්තර තුන අතුරින් කබොල බෙදිය හැකි ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. (ල. 02)

(ii) අපරිවර්ති ගෝලයෙහි විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

(iii) (a) වායුගෝලීය දූෂණයට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න.

(b) වායුගෝලය දූෂණය වීමෙන් භෞතික හා මානුෂ පරිසරයට ඇතිවන බලපෑම් දෙකක් විස්තර කරන්න. (ල. 05)

❖ අංක 3 සහ 4 ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සඳහා පහත දැක්වෙන ලෝක සිතියම භාවිත කරන්න.




(03) (i) ලෝකයේ කපු පිළි නිපදවන රටවල් දෙකක් ඉහත ලෝක සිතියමේ A හා B අක්ෂරවලින් දැක්වේ. එම රටවල් දෙක පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02)

(ii) (a) කපු පිළි කර්මාන්තයේ ලක්ෂණ හා ප්‍රවණතා දෙකක් ද,

(b) කපු පිළි කර්මාන්තයේ නියුතු රටවල් වර්තමානයේදී මුහුණපාන ගැටලු එකක් ද, සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) ශ්‍රී ලංකාවේ සිදු කෙරෙන ගෘහ කර්මාන්ත දෙකක් නම් කරන්න.

(b) ගෘහ කර්මාන්ත සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියා මාර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

(04) (i) (a) ඉහත සිතියමේ අංක (1)න් දැක්වෙන කොරෝනා වෛරසය ව්‍යාප්ත වීම ආරම්භ වූ රට නම් කරන්න.

(b) සිතියමේ අංක (2)න් දැක්වෙන භූමි කම්පා සිදුවන කලාපය නම් කරන්න.

(ලකුණු 02)

(ii) (a) සිතියම් අංක (3) න් දැක්වෙන මෑතකදී ලැව් ගින්නක් හටගැනීම නිසා දේපළ හා සත්ත්ව ජීවිත විනාශ වූ රට කුමක් ද?

(b) ලැව්ගිනි ඇතිවීමට බලපාන මානුෂ හේතු එකක් සහ ස්වාභාවික හේතු එකක් ලියන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ නායයෑම් බහුලව සිදුවන දිස්ත්‍රික්ක දෙකක් නම් කර, නායයෑම් ආපදාව අවමකර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 05)

(05) (i) ආසියා මහාද්වීපයෙහි රටවල් අතුරින් වැඩිම ජන සංඛ්‍යාවක් වාසය කරන රටවල් දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ලෝකයේ අධි ජන සංකේන්ද්‍රණ කලාපවල දැකිය හැකි විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) (a) බස්නාහිර පළාත තුළ ජන සංඛ්‍යාව වැඩි වීමට බලපා ඇති හේතු දෙකක් සඳහන් කරන්න.

(b) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තියෙහි අසමානතා අවම කර ගැනීමට ගත හැකි ක්‍රියා මාර්ග දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) පහත සඳහන් අවස්ථාවල දී නිර්මාණය වන ආග්නේය පාෂාණ වර්ගය කුමක්දැයි අනුපිළිවෙළින් නම් කරන්න.

(a) පෘථිවි අභ්‍යන්තරයේ මැග්මා සිසිල් වී ඝණීභවනය වීමෙන් නිර්මාණය වන පාෂාණ වර්ගය

(b) පෘථිවි අභ්‍යන්තරයේ උණු වූ මැග්මා මතුපිටට පැමිණ සිසිල්වීම හේතු කොට නිර්මාණය වන පාෂාණ වර්ගය (ලකුණු 02)

(ii) ආග්නේය පාෂාණ වල ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ වනාන්තර සංරක්ෂණය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර, ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(07) (i) සංවර්ධනය මැනීම සඳහා යොදාගත් මුල්කාලීන මිණුම් දෙකක් ලියන්න. (ලකුණු 02)


(ii) ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපල හා වරාය සංවර්ධනය සඳහා මෑත කාලීනව ගෙන ඇති ක්‍රියා මාර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකාවේ මානව සම්පත් සංවර්ධනය කිරීමේදී අධ්‍යාපන ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 05)


(08) (i) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම කෙරෙහි බලපාන අහිතකර වායු වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ගෝලීය උෂ්ණත්වය වැඩිවීම නිසා මිනිසාට වර්තමානයේ දී හා අනාගතයේ දී මුහුණ පෑමට සිදුවන අයහපත් ප්‍රතිවිපාක තුනක් ලියන්න. (ලකුණු 03)


(iii) දේශගුණික වෙනස්කම් අවම කර ගනිමින් ගෝලීය උෂ්ණත්වය අඩුකර ගැනීමට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් විස්තර කරන්න. (ලකුණු 05)




SCALE 1 : 50, 000



(ආ)




(i)

(ii)


(iii)

(iv)

(v)

/5

(ඉ) /(இ)/(c)




(i)

(ii)

(iii)

(iv)

(v)

/5

1. (අ) (அ) (a) /10 (ආ) (ஆ) (b) /5 (ඉ) (இ) (c) /5 = /20

**නව නිර්දේශය**

**භූගෝල විද්‍යාව II** **විභාග අංකය ................................**

**(01)** **(අ)** (i) ..........................................................

(ii) ..........................................................

(iii) ..........................................................

(iv) ..........................................................

(v) ..........................................................

(vi) ..........................................................

(vii) ..........................................................

(viii) ..........................................................

(ix) ..........................................................

(x) ..........................................................

10

(01) (අ) 10 (ආ) 05 (ඉ) 05 = 20

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I,II |

## I පත්‍රය සඳහා පිළිතුරු

| | | | |
|---|---|---|---|
| (1) පරිවර්තී | (11) අප්‍රිකා | (21) 4 | (31) 2 |
| (2) 29% | (12) දූපත් | (22) 1 | (32) 4 |
| (3) එරල් මුහුද | (13) කේතුධර | (23) 2 | (33) 1 |
| (4) වර්නෝසම් | (14) අයිස්ලන්තය | (24) 1 | (34) 3 |
| (5) 2 | (15) රාෂ්ට්‍රීය | (25) 3 | (35) 2 |
| (6) නි | (16) 2001 | (26) 4 | (36) 2 |
| (7) නි | (17) 70 | (27) 2 | (37) 4 |
| (8) වැ | (18) 2009 | (28) 1 | (38) 3 |
| (9) වැ | (19) 2 | (29) 3 | (39) 1 |
| (10) නි | (20) 3 | (30) 1 | (40) 2 |

(ලකුණු 40)

## II පත්‍රය සඳහා පිළිතුරු

(01) (අ) (i) ත්‍රිකෝණමිතික උස
(ii) වාරිමාර්ගය
(iii) කපොල්ල
(iv) වනාන්තර
(v) පොල්
(vi) A
(vii) පාසල/තැපැල් කාර්යාලය/බෞද්ධ සිද්ධස්ථානය (මින් 01ක්)
(viii) ව.කි.මී 1 1/2 (1 1/2 $km^2$ / 1.5$km^2$)
(ix) G
(x) 04 කි. (ලකුණු 10)

(ආ) (i) B (ii) D (iii) H (iv) L (v) R (ලකුණු 05)

(ඉ) (i) C (ii) D (iii) H (iv) L (v) R (ලකුණු 05)

(02) (i) මහාද්වීපික හා සාගරික (ලකුණු 2)

(ii) - ඉහළ සීමාව මුහුදු මට්ටමේ සිට 48 - 50 km දක්වා විහිදේ.
- උෂ්ණත්වය උන්නතාංශය සමඟ ක්‍රමයෙන් ඉහළ යාම
- ඕසෝන් ස්තරය පිහිටා ඇත.
- උල්කාශ්ම දැවී විනාශ වී යාම.
- සුපර්සොනික් ජෙට් යානා පියාසර කරන කලාපය

ලක්ෂණ 03 ක් ලිවීමට (ලකුණු 3)

(iii) a. - කර්මාන්තශාලා වලින් පිට කරන විෂ දුම්
- වනාන්තර ගිනි තැබීම්
- අහිතකර අපද්‍රව්‍ය/කැලිකසල ගිනි තැබීම්
- මීතේන් ක්ලෝරොප්ලෝරෝ කාබන් (CFC වායුව) මුදා හැරීම කරුණු 02 ක් ලිවීමට

b. - වායුගෝලයේ $C0_2$ ප්‍රතිශතය වැඩිවීමෙන් ග්ලැසියර දියවී මුහුදු ජල මට්ටම ඉහළ යාම
- කාලගුණික හා දේශගුණික විපර්යාස ඇතිවීම
- අහිතකර වායු වර්ග ආශ්වාස කිරීමෙන් ලෙඩ රෝග ඇතිවීම
- ශාක පද්ධති විනාශ වීම නිසා ඇතිවන අහිතකර බලපෑම්
- හිතකර සතුන් වඳවී යාම හා කෘමි සතුන්ගේ ගහණය වැඩිවීම
මෙවැනි බලපෑම් දෙකක් විස්තර කිරීම (ලකුණු 2+3=5)

(03) (i) A - ඉන්දියාව B - ඇ.එ.ජ (ලකුණු 2)

(ii) (a) - කපුපිළි කර්මාන්තයට දිගු ඉතිහාසයක් පැවතීම.
- කෘෂි පාදක අමුද්‍රව්‍ය මත පදනම් වීම.
- වර්තමානයේ කපු වවන රටවල් කපු පිළි නිෂ්පාදනයට අවතීර්ණ වීම.
- 21 වන සියවසේ දෙවන භාගයේ සිට නැගෙනහිර ආසියාතික රටවල් ප්‍රමුඛත්වය ගැනීම.
- කපුපිළි නිෂ්පාදනය මුළුමනින්ම යාන්ත්‍රිකරණය වීම.
- වෙනත් කෙඳි වර්ග සමඟ මිශ්‍රකර ගුණාත්මක රෙදි නිපදවීම
- අතුරු කර්මාන්ත ක්ෂේත්‍ර බිහිවීම
ප්‍රවණතා 02 ක් ලිවීම

(b) - ශ්‍රමය ආශ්‍රිත ගැටලු, වෙළඳපල ආශ්‍රිත ගැටලු, අමුද්‍රව්‍ය ආශ්‍රිතව පවතින ගැටලු සුදුසු පරිදි 01 ක් ලිවීම (ලකුණු 3)

(iii) (a) ලී බඩු, වේවැල් භාණ්ඩ, වෙස්මුහුණු, බීරළු හා රේන්ද, අත් යන්ත්‍ර රෙදි පිළි, රසකැවිලි ආදී දෙකක් ලිවීමට (ලකුණු 2)

(b) - දිවි නැගුම ජාතික සංවර්ධන වැඩ සටහන
- කර්මාන්ත ගම්මාන ඇති කිරීම
- හස්ත කර්මාන්ත සංවර්ධන වැඩ සටහන
- ශ්‍රමිකයින් පුහුණු කිරීම
- නිෂ්පාදකයින් ධෛර්යමත් කිරීමට වැඩ සටහන්
ක්‍රියාමාර්ග තුනක් ලිවීම (ලකුණු 3)

(04) (i) (a) චීනය (b) පරිපැසිපික් කලාපය (ලකුණු 2)

(ii) (c) ඕස්ට්‍රේලියාව

(d) මානුෂ හේතු 01 ක්
- ගිනි තැබීම්
- ගොඩනැගිල්ල මත ගිනි තැබීම්

ස්වාභාවික හේතු 01 ක්
- දැඩි නියගය හා වියළි සුළං
- ශාක කඳන් එකට ඇතිල්ලීමෙන් ගිනි ඇතිවීම
- අකුණු සැර වැදීම
- ගිනිකඳු පිපිරීම (ලකුණු 3)

(iii)
- මහනුවර, මාතලේ, කෑගල්ල, නුවරඑළිය, බදුල්ල, රත්නපුරය, කළුතර, ගාල්ල, මාතර මින් දිස්ත්‍රික්ක 02 ක් ලිවීම.
- බෑවුම් ඉඩම්වල ඇති වෘක්ෂලතා වැස්ම ආරක්ෂා කිරීම.

- ස්වාභාවික ජල වහනය අවහිර නොකිරීම.
- උස් ප්‍රදේශවල ජලාශ ඉදි නොකිරීම.
- ශීඝ්‍ර බෑවුම් සහිත ඉඩම්වල ගොඩනැගිලි ඉදි නොකිරීම.
- බෑවුම් ඉඩම් පරිහරණයේදී විද්‍යාත්මක උපදෙස් අනුගමනය කිරීම.
- බෑවුම් සහිත ඉඩම්වල ස්ථායිතාව ආරක්ෂා වන පරිදි ක්‍රියාමාර්ග ගැනීම (ගල්වැටි, කුට්ටි කාණු, වනවගා)
- ප්‍රජාව දැනුවත් කිරීම. (ලකුණු 2 + 3 = 5)

(05) (i) චීනය හා ඉන්දියාව (ලකුණු 2)

(ii) - වෙරළබඩ ආශ්‍රිතව පිහිටා තිබීම
- හිතකර භෞතික පරිසරයක් තිබීම
- ගමනාගමන පහසුව
- වෙළෙඳාම
- වෙනත් ආර්ථික ක්‍රියාවන්ට යෝග්‍ය වීම

කරුණු තුනක් ලිවීම (ලකුණු 3)

(iii) (a) - වාණිජ හා පරිපාලන කටයුතු (බැංකු,වරාය...)
- අධ්‍යාපන කටයුතු
- සේවා කටයුතු (මාර්ග පහසුකම් ප්‍රවාහනය)
- කර්මාන්ත

අදාල වන පරිදි හේතු දෙකක් ලිවීම.

(b) ඉහත (a) වල සඳහන් කරුණු අනෙකුත් දිස්ත්‍රික්ක කරා ව්‍යාප්ත කළ හැකි ආකාරය විස්තර කිරීම. (ලකුණු 2 + 3 = 5)

(06) (i) (a) ආක්‍රාන්ත ආග්නේය පාෂාණ

(b) නිෂ්ක්‍රාන්ත ආග්නේය පාෂාණ (ලකුණු 3)

(ii) - ග්‍රැනයිට් යොදා ගනිමින් ගොඩනැගිලි ඉදිකිරීම
- විසිතුරු භාණ්ඩ නිර්මාණය කිරීම
- ටින්, ක්‍රෝමියම් වැනි ඛනිජ ලබා ගැනීම
- ඛාදනයට ඔරොත්තු දෙන බැවින් බෑවුම් ප්‍රදේශ ආරක්ෂාවට යොදා ගැනීම
- මහාමාර්ග ඉදිකිරීමට භාවිතය (ප්‍රයෝජන තුනක් ලිවීම) (ලකුණු 3)

(iii) - ජාතික රක්ෂිත හා අභයභූමි පවත්වාගෙන යාම.
- වන වගා ව්‍යාපෘති ඇතිකිරීම.
- වන සංරක්ෂණ උපාය මාර්ග අනුගමනය කිරීම.
- ප්‍රජා සහභාගීත්ව වන වගාව දිරි ගැන්වීම.
- රුක් රෝපණ හා වනාන්තර ඵලදායිතාව වර්ධනය කිරීම.
- වන විනාශයේ අහිතකර ප්‍රතිඵල පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
- පරිසර සංවේදීකලාප ඇති කිරීම.
- වනසම්පත් ආරක්ෂා කිරීම හා පවතින නීති-රීති බලගැන්වීම

(මින් ක්‍රියාමාර්ග තුනක් සඳහන් කර, ඉන් එකක් විස්තර කළ යුතුය.) (ලකුණු 2 + 3 = 5)

(07) (i) ඒක පුද්ගල ආදායම, දළ දේශීය නිෂ්පාදිතය, ඒක පුද්ගල බලශක්ති පරිභෝජනය, මිනිසුන් දහසකට ඇති ගුවන් විදුලි යන්ත්‍ර සංඛ්‍යාව......... ආදී මිනුම් දෙකක් ලිවීම. (ලකුණු 2)

(ii) - කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධනය
- මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල ඉදි කිරීම.
- රත්මලාන, පළාලි, අනුරාධපුරය ආදී අභ්‍යන්තර ගුවන් තොටුපලවල් සංවර්ධනය
- කොළඹ වරාය, ඔලුවිල් වරාය සංවර්ධනය
- මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය ඉදි කිරීම
- කොළඹ වරාය නගරය ඉදිකිරීමට කටයුතු කිරීම
- උතුරු නැගෙනහිර හා ගාල්ල ඇතුළු පැරණි වරාය සංවර්ධනය
(මෙවැනි ක්‍රියාමාර්ග තුනක් ලිවීම) (ලකුණු 3)

(iii) ශිෂ්‍යාධාර, නවීන විද්‍යාගාර පහසුකම්, නවෝද්‍ය පාසල්, කාර්මික විද්‍යාල, බහුතාක්ෂණික විද්‍යාල, විශ්ව විද්‍යාල හා ශිෂ්‍ය ප්‍රමාණය වැඩි කිරීම, උසස් පෙළට තාක්ෂණ විෂය ධාරාව හඳුන්වා දීම, විද්‍යාපීඨ පරිගණක පුහුණු ආයතන, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඇතුළුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුව සඳහා ගෙන ඇති ඕනෑම ක්‍රියා මාර්ග තුනක් විස්තර කිරීම. (ලකුණු 5)

(08) (i) කාබන්ඩයොක්සයිඩ්, මීතේන්, නයිට්‍රස් ඔක්සයිඩ්, ක්ලෝරොෆ්ලෝරෝ කාබන් වැනි වායු වර්ග දෙකක් ලිවීම.(ලකුණු 2)

(ii) - ධ්‍රැවීය අයිස් නිධි දිය වී මුහුදු ජල මට්ටම ඉහළ යාම
- දේශගුණික විපර්යාස ඇතිවීම
- ඇතැම් ජීවීන් වඳවීම හා නව ගහන බිහිවීම
- භෝග විනාශය හා අස්වැන්න අඩු වීම
- සාගර ජල උෂ්ණත්වය වැඩිවීම හා ජලජ පැලෑටි හා ජීවීන් විනාශ වීම, පානීය ජල මූලාශ්‍ර දූෂණය වීම
මෙවැනි අදාල කරුණු තුනක් ලිවීම (ලකුණු 3)

(iii) - CFC වායු විමෝචනය නතර කිරීම.
- වාහන දුම් පරීක්ෂාව
- පොසිල ඉන්ධන පරිභෝජනය අවම කිරීම
- ප්‍රතිජනන බලශක්ති පරිභෝජනයට නැඹුරු වීම
- හරිත වන වගාව, රුක්රෝපණ වැඩ සටහන්, සදළුතල වගාව ජෛවීය පොහොර භාවිතය ......
මෙවැනි ක්‍රියාමාර්ග තුනක් විස්තර කිරීම
(ලකුණු 5)